// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1942/17 - 2015 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2015.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: BLDS/LND/7/1/1/127.
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය.*: *4-3/5/2013/*HW/567.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩු අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සාශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙලඋඩපත්තුව සුළු කොට්ඨාසයේ, 258බී මැදබැද්ද ග්‍රාම නිලධාරී වසමේ මැදබැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 620270 කලාප 02න් 06 වැනි කලාපය දරන පිඹුරෙහි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0246ක් වූ පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කැබලි.

උපලේඛනය

01. **කැබලි අංකය 232**
ඉඩමේ නම: මැදබැද්ද; විස්තරය: හිමිකම් කියන අය: රජය, පී. එම්. නිහාල් ධර්මදාස බණ්ඩාර, වෙලිඔය, බලංගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0026.

02. **කැබලි අංකය 234**
ඉඩමේ නම: මැදබැද්ද; විස්තරය: හිමිකම් කියන අය: ප්‍රාදේශීය සභාව, බලංගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0064.

03. **කැබලි අංකය 235**
ඉඩමේ නම: මැදබැද්ද; විස්තරය: හිමිකම් කියන අය: රජය, පී. එම්. පී. දමයන්ති, වෙලිඔය, බලංගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0068.

04. **කැබලි අංකය 236**
ඉඩමේ නම: මැදබැද්ද; විස්තරය: හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0033.

05. **කැබලි අංකය 237**
ඉඩමේ නම: මැදබැද්ද; විස්තරය: හිමිකම් කියන අය: රජය, පී. එම්. පී. දමයන්ති, වෙලිඔය, බලංගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0028.

06. **කැබලි අංකය 240**
ඉඩමේ නම: මැදබැද්ද; විස්තරය: හිමිකම් කියන අය: රජය, පී. එම්. පී. දමයන්ති වෙලිඔය, බලංගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0027.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2015 දෙසැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2015 දෙසැම්බර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

වම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-382

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 22627 - 26 - (2015/11)

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

අංක 1852/37 හා 2014.03.06 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 8A පිටුවේ මගේ අංක 11/3/3/1/9A දැන්වීමෙහි පිඹුරු අංකය හුලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 13හි අතුරු පිඹුරු අංක 229හි පත්‍ර අංක 176 A යනුවෙන් සාවද්‍ය ලෙස සඳහන් වී ඇත. එය හුලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 13හි අතුරු පිඹුරු අංක 229හි පත්‍ර අංක 176 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

නිරෝෂණ කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල-පල්ලේගම.

2015 නොවැම්බර් මස 27 වැනි දින,
ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-383

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.